

මන්තරේ බලේ

සෙනෙවිරත්න මට වඩා තරමක් උස ය. ඔහු දිනපතා පාසලට නොඑන ඉඳහිට දවසක් අතරින් පතර පැමිණෙන ළමයෙකි. පාසල් වැඩවලට දක්ෂ නැත. මගෙන් ''කොප්ප'' ගහන කීප දෙනාගෙන් කෙනෙකි. ගණන් පාඩමේ දී ගණනේ උත්තරය බොහෝ ළමයින් බොහෝවිට දැනගන්නේ මගෙනි. මට සියලු ම විෂයන්ට වඩා පහසු, ලෙහෙසි ම විෂය ගණන් ය. එහෙත් බොහෝ දෙනෙකුට අමාරු ම විෂය ද අංක ගණිතය යි. එකතු කිරීම, වැඩි කිරීම, අඩු කිරීම, බෙදීම ආදී සරල ගණන්වල උත්තරය මගේ තිවරුදි ය. හරියට ම හරි ය. එබැවින් මා අසල සිටින ළමයින්ගේ උත්තර ද තිවැරැදි ය. මගේ ඇසුර බොහෝ දෙනෙකු ප්‍රිය කළේ කොපි ගහ ගන්නට හොඳම කෙනා මා නිසාය.

සෙනෙවිරත්න ගේ පියා බොහෝ මන්ත්‍ර ශාස්ත්‍ර දන්නා, ඒ අනුව තම ජීවිතය ගැට ගසා ගන්නා අයෙකි. තම නිවසේ ශාස්ත්‍ර කීමේ දේවාලයක් පවත්වාගෙන යනු ලබන අතර වෙනත් වෙනත් ස්ථානයන්හි ගුරුකම් කටයුතු සඳහා ද ගොස් දිවිමග සරිකර ගන්නා අයෙකි. තරමක් සැඩ පරුෂ ය. විශාල ශරීරයක් නැති, කුඩා මිනිසකු වුවත් බොහෝ දෙනා ඔහුට සළකන්නේ තරමක් සැක බියෙන් යුතුව බව පළාතේ බොහෝ දෙනකුගේ මතය යි.

මගේ ගණන් කොපි කරන සෙනෙවිරත්න ද යම් යම් මන්ත්‍ර කටපාඩම් කරගෙන ඇති අයෙකි. ඔහු ද මන්ත්‍ර කීපයක් මට ද දී තිබුණි. පාඩම් හිටින මන්ත්‍රය. සර්පයන්ගෙන් බේරීමට මන්ත්‍රය, ලේ නැවැත්වීමේ මන්ත්‍රය, මකුණන්ගෙන් බේරි සිටීමට මන්ත්‍රය ඇතුළු මන්ත්‍ර කීපයක් ඔහුගෙන් මට ලැබී තිබුණි. පාඩම් හිටින මන්ත්‍රය කළ යුත්තේ අතමිට මොළවා අතට මතුරා අත දිග හැර මුහුණ අත ගා ගෙන පාඩම් කිරීම ය. සෙනෙවිරත්න ද එම මන්ත්‍රයෙන් පසුව පාඩම් කිරීම කරන බව මට පවසා තිබුණි. මන්ත්‍ර බලයෙන් හෝ මාගේ ධාරණ ශක්තියෙන් හෝ මට පාඩම් හිටියත් සෙනෙවිරත්නට මන්ත්‍රය තාම වැඩ කළේ නැති බව පැවසිය හැක්කේ ඔහු හැමදාම මගෙන් කොපි ගැසීමට පුරුදුව සිටි නිසාත්, ගුරුවරයා අසන සෑම ප්‍රශ්නයකට ම නිරුත්තර ව බලා සිටින පුද්ගලයකු වීමත් නිසා ය. ලේ නැවැත්වීමේ මන්ත්‍රය කළ යුතු වන්නේ ගසකින් කොළයක් කඩාගෙන තුවාලය මත තබා මන්ත්‍රයෙන් හත් විටක් මතුරා කොළය ඉවත් කිරීමයි. සර්පයින්ගෙන් බේරීමේ මන්ත්‍රය කරන්නේ, මන්ත්‍රය හත් සැරයක් හෙමිහිට කියා දෙකකුලට කෙළ ගසා ගනිමින් ගමන ආරම්භ කිරීම ය. මකුණන්ගෙන් බේරීමේ මන්ත්‍රයෙන් අල්ලට මතුරා තමා හිඳ හන්නා පුටුව හෝ නිදා ගන්නා ඇඳ අතගෑ යුතු වේ.

මන්ත්‍රවලින් කරන වැඩ ගැන සමහරවිට ඔහු පවසන්නේ අප බියපත්වන ලෙසිනි. ඒවායේ ඇති අනිටු ප්‍රතිඵල ආදිය පිළිබඳ ව පවසන විට සමහර විටක ඇඟ හිරි ගඩු පිපේ.

තොවිල්පෙවිල් පිළිබඳ ව සහ ඒවායින් කරනු ලබන විශ්ව කර්ම වැඩ පිළිබඳව ද ඔහු පවසන දේ අප අසා සිටින්නේ බියමුසු ව ය.

''සර්පයන් මැරීමේ මන්ත්‍රය පිළිබඳ ව ඔහු පැවසූ කතාව අඳත් සිතට ගෙන එන්නේ බියකි. එය සමහරුන් අපහසුවට පත්කරවීමක් විය. මන්ත්‍ර ශාස්ත්‍ර දැනගෙන භාවිත කරන ගුරුකමක් ලෙස සෙනෙවිරත්න විසින් මට පවසා තිබූ එම ''ගුරුකම'' කරන ආකාරය මෙලෙස ය. අහරකුක්කා යනු අපට නිතරම මුණ ගැහෙන අහිංසක සර්පයෙකි. අහරකුක්කා අප එතරම් සැළකිලිලට නොගන්නේ උගෙන් කිසිවෙකුට හානියක් සිදු නොවන නිසා ය.

සෙනෙවිරත්න එය විස්තර කළේ මෙසේ ය.

''ඔන්න අල්ල ගන්නව අහරකුක්කෙක්, හොඳද? ලාව මරනව.''
''ඉතින් අල්ලගෙන මරන්න ඕනෑ. මරල අල්ලගත්තොත්?'' ඒ මගේ ප්‍රශ්නය යි.
''කමක් නෑ, උඹ පණ්ඩිතය වෙන් නැතුව අහගෙන හිටපන්කො''
''ගන්නව තරමක කුරුම්බ ගෙඩිඩක්. ඒකෙ වතුර ටික අහකට දානවා.''
''වතුර ටික බොන්න හොඳ නැද්ද? අපරාදේ ලොඳ ටික.'' මට කට වහගෙන සිටීමට අපහසු වූයේ කුරුම්බා කෑමට මගේ ඇති පෙළේතකම නිසා ය.

''බොන්න හොඳ නැහැ බුරුවො. උඹ සෙල්ලමක් කියල හිතුවද? ලොඳ නීන එකක් නෙමෙයි ගන්නෙ. ඇට්ටියක්.''
''හා හා කියපන් කියපන්''
ඒකෙ වතුර ටික අයින් කරල ඒක ඇතුළට දානව අහරකුක්කව. දාලා පියන්පත ගහනව.
''පියන්පත කියන්නෙ?''
''ඒකවත් දන්නැද්ද? අර බං තැඹිලි කපල ගෙඩිය හිල්කරල ගන්න කෑල්ලට කියන්නේ පියන්පත කියල.''
''හා ඉතින්''

''ඒක ගහල අඩි තුනක් විතර යටින් පොළොවෙ වළලනව.''
''අම්මෝ'' අපගේ දෑස් ලොකු වී ඇත. එකිනෙකා මුහුණ බලා ගෙන සිටිති.
''පස්සෙ තුන් මාසයකට පස්සෙ ගොඩ ගන්නව. අරගෙන පියන්පත ගලෝනව.''
''ඒ ගඳ නැද්ද යකෝ''
''පළාතෙ ඉන්න බෑ. ඒ උණාට මක් කරන්නද? ඒක ඇතුළට දානව පස්නෙල්. දාල, ආයිත් වහල ජප කරනව. මන්ත්‍රය කියල එකසිය අට සැරයක් මතුරල ඉවරවෙලා ඒ නෙල්ටික දානව කුප්පියකට. ඊට පස්සෙ ඒක හොඳට වහල තියනවා.''
''ඊට පස්සේ?''

''ඉතින් කාගෙ හරි ගෙදරකට ගිහිල්ලා පැටොමැක්ස් ලාම්පුවෙ තෙල් බින්දුවක් ගානව''
''ඉතින්?''
''ඉතින් බලන්නෙපායැ. ලාම්පුව වටේට අහර කුක්කො දුවනව. මිනිස්සු පුදුම වෙනව. බය වෙනව. ළමයි බයේ දුවනව. කර ගන්න දෙයක් නෑ.''

සෙනෙවිරත්න විස්තර කරන්නේ රඟපාමිනි. බය වෙන හැටි, දුවන හැටි ඔහු නිරූපනය කර පෙන්වයි.

''ඈ බං සෙනෙවියො උඹ දැකල තියෙනව ද? ....''
''නෑ මං දැකල නෑ. කියනව''

මහා සර්ප විමානයක කොටු වී සිටි අප තරමක් දුරට සර්ප බියෙන් නිදහස් වුණේ ඉන් පසුව ය.
''බොරු වෙන්නැති'' එකෙක් පවසති.
''බොරු? හිටපන් උඹට මං කරල පෙන්නන්නං?''

''අනේ සෙනෙවියො. ඇත්ත ඇත්ත. මං උඹට කියන විදියකට වඳින්නම්. අනේ අපිට එහෙම කරන්න එපා.''

මම සත්‍යයට සහ අසත්‍යයට මැදිවී ඈණුම් ඇරියෙමි.

එක් දිනක් සෙනෙවිරත්න මට පැවසුවේ හොඳ මන්ත්‍රයක් ගෙනා බව ය. මේ මන්ත්‍රය දැනගන්නා තුරු මට ඉස්පාසුවක් නැත.

''මොකක්ද?''
''පස්සෙ කියන්නංකො. ඉන්ටවල් එකේ දි කියන්නං''

විවේක කාලයේ දී සෙනෙවිරත්න රහස කියන්නට මා ළඟට පැමිණ මා කැඳවාගෙන ගියේ පහළ බෑවුමට ය.

''මේක මරු වැඩක්. මමත් කළා. ෂෝක් වැඩේ. ඕනෑම කඩි ගුලකට අත දාන්න පුළුවන්. යං මං කල්ල පෙන්නන්නං.'' සෙනෙවිරත්න ඉස්සර වී ය. අපි කඩි ගුලක් සොයා ගියෙමු. පාසලට පහළින් ඇති පඳුරක් අවුස්සා කඩි ගුලක කඩියන් ඇවිස්සුවේ කෝටු කැබැල්ලකිනි. සෙනෙවිරත්න දකුණු අත මිට මොළවා මුහුණට කිට්ටු කොට තොල් මතුරමින් කෝටු කැබැල්ල අතින් අතට ගෙන බිම වාඩි වී කඩිගුල අවුස්සමින් ඒ තුළට අත දමා අත දිග හැරියේ ය. පුදුමයෙකි.

සෙනෙවිරත්නගේ අත කඩි කන්නේ නැත. ඔහු අත දෙපස පෙරලමින් කඩියන් අතරින් අත යවයි. ''කාපන් කාපන්'' යනුවෙන් කියයි. එහෙත් කඩින්ගෙන් විපතක් නැති බව තහවුරු ය.

''යං මං මන්තරේ දෙන්නං. කාටවත් දෙන්න එපා. කියන්නත් එපා. හොඳේ.''
සෙනෙවිරත්න කඩිගුලෙන් අත ඉවතට ගෙන පන්තිය දෙසට ගියේ මට ඉස්සර වෙමින් ය.

දැන් මට මන්තරය ලබා ගන්නා තුරු ඉස්පාසුවක් නැත. එය මරු වැඩකි. අම්මලාට, මල්ලිලාට හපන්කම් පෙන්විය හැකි ය. පන්තියට ගිය සෙනෙවිරත්න පොතක් ඇතුළේ තිබූ කොළ කැබැල්ලක් මා අත තැබුවේ ය. මම වහා කියවා බැලීමි. මගේ මතකයේ හැටියට එහි තිබුණේ ''ඕං නමෝ නිකළඳ පුට්ටු පූට්ටු ඒස්වාහස'' යන්න ය.

''බය වෙන්න එපා. අත මිට මොළවල හත්පාරක් මන්තරේ කියවපන්. අතට මතුරපන්. පස්සෙ කඩි ගුලට අත දාල අත දිග ඇරපන්.''

එදින මට ගෙදර යනතුරු ඉස්පාසුවක් නැත. වැඩේ අත්හදා බැලීමේ අවශ්‍යතාව දැඩි ය. ගෙදර යන අතරතුර මා පිරිසෙන් වෙන් වූයේ උවමනාවෙන් ම ය. අතුර මුකළාන මැද්දෙන් අඩි පාර දිගේ ගොස් කැලෑ මණ්ඩියක දී පාරෙන් ඉවත්ව තරමක් දුරට ගොස් කඩිගුලක් ඇති පඳුරක් යටින් වාඩි වී, පොත්ටික බිමින් තබා මන්තර කඩදාසිය වමතට ගෙන දිගහැර දකුණ මිට මොළවා කඩදාසිය දෙස බලාගෙන හත් පාරක් කීවෙමි. කඩදාසිය සාක්කුවකට දමාගෙන කෝටු කෑල්ලකින් බෝවිටියා පඳුර යට කඩිගුල අවුස්සා කඩි ගුලට අත දමා දිග හැරියෙමි.

වැඩේ හරි ය. එක කඩියෙක් හෝ දෂ්ට කළේ නැත. කිසියම් වූ ''ඒඃ'' ශබ්දයකින් අතට කෙටුවත් එය අතට දැනෙන්නේ නැත. මට ඇතිවුණු සොම්නස කොතරම් දැ යි කිව නොහැකි ය. විනාඩි කීපයක් කඩිත් සමග සෙල්ලම් කරමින් සිට නිවසට ගියෙමි.

නිවසේ දී ද කඩිගුල් කීපයක් අවුස්සා, අත් හදා බැලුවෙමි. අපේ වත්ත පහළ අස්වැද්දුම පැත්තට වෙන්නට ඇති කුරුඳු මණ්ඩියේ හැම කුරුඳු ගහක් යට ම කඩිගුල් ය. මේ බොහෝ ගස් යට හිඳ මන්තරය අත්හදා බැලුවෙමි. වැඩේ හරියට ම හරි ය. දැන් මට උවමනාව ගෙදර අයට මේක පෙන්වීමට ය. සවස් වන විට මේ හාස්කම හෙවත් මගේ හපන්කම අප නිවස වටපිට සෑම නිවසක ම අයට පෙන්වා දුන්නෙමි.

දැන් මා අමුතු ම වීරයෙකි. හපන් කමක් කළ හැකි අයෙකි. ''මාත් කරල පෙන්නන්නන්'' කියූ සෝපාල අයියා එක කඩිගුලකට අත මිට මොළවා දමා වහා අත ඉවතට ගෙන හෙමිහිට ඉවතට යන්නට වූයේ කඩි දෂ්ට කළ නිසා විය යුතු ය.

දැන් මගේ උවමනාව පාසල් ළමයින්ට මගේ හාස්කම පෙන්වීමට ය. පසුදින පාසල් ගිය මට හමුවන හැම ළමයකුගෙන් ම වාගේ ඇසුවේ ''කඩිගුල්වලට අත දාන්න පුළුවන්ද? මට පුළුවන් දාල පෙන්නන්නන්'' කියා ය. දහවල් විවේක කාලය එනතුරු ඔවුන් සිටින්නේ ද මගේ හාස්කම බැලීමට ය. මගේ උවමනාව ඔවුන්ට මගේ කෙරුවාව පෙන්වීමට ය.

ඉන්ටවල් සීනුව වැදුණි. බගිස් කෑමෙන් පසුව ළමයින් දහ දොළොස් දෙනෙකු මා පසුපස ආවේ මගේ මන්තර හාස්කම දැක ගැනීම සඳහා ය. එදා සෙනෙවිරත්න නොපැමිණ සිටීම මගේ හිතට තවත් හොඳ ය.

රට දෙල්ගහ යටින් පහළට ගොස් එළවලු පාත්ති අතර තිබූ කඩිගුලක් අවුස්සා ගනිමි. ළමයින් සියල්ලෝ ම දැන් බලා සිටිති. මා අතමිට මොළවා අතට මැතිරුවේ කිසිවකුට නෑසෙන පරිදි ය. හයියෙන් කීවොත් ඔවුන් එය පාඩම් කරගෙන මගේ හපන්කම දියාරු කරනවා ඇත.

''ඔන්න බලාගන්න. මේං බලාගනිං. ඕං එහෙනන් කියමින් මම කඩිගුල අසළ බිම වාඩි වී වම් අතේ කෝටුවෙන් කඩිගුල තුළ සිටි කඩි අවුස්සා අත දමා දිගහැරියෙමි.

එකවිට ම උඩ විසිවුණු මට ''අම්මෝ බුදු අම්මෝ'' යනුවෙන් කියැවුණේ ඉබේට ම ය. වමතින් දකුණත බඳාගෙන දෙකට නැමී කෑ ගැසුවෙමි. එදා මන්තරය හරිගියේ නැත. වටේ සිටි පිරිස මහා හයියෙන් හිනාවෙති. මම වේදනාවෙන් කෑ ගසමි. හිනාවට වඩා ඔවුන්ගේ උසුළු විසුළු කෙළවරක් නැත. සමහරු බඩ අල්ලාගෙන සිනාසෙති. මම වේදනාවෙන් ඉවතට දිවීවෙමි. ක්‍රමයෙන් කඩි කෑ වේදනාව අඩු වූවත් පන්තියට යාමට ඇති ලජ්ජාව වේදනාවට වැඩි ය. එහෙත් ඊළඟට තිබෙන පීරියඩ් එක ගණන් ය. එය මගේ ප්‍රියතම විෂය නිසා මග හැරිමටත් නොහැකි ය. මා පන්තිය ඇතුළට යනවිට කීප දෙනකුගේ ම කට තුළ හිරකරගෙන තිබුණු හිනාව එළියට පැන්නේ මගේ මුහුණට එබ්බකම් කරමින් ය.

ගණන් උගන්වන ගමගෙ මහත්තයා පන්තියට පැමිණීම මගේ භාග්‍යයක් විය. එදින සිට අද තව වනතුරු මා කඩිගුල්වලට අත දමා නැත.